# ජන කවියෙන් නිරූපිත මුල් බුදු සමයේ දාර්ශනික භාවිතයන් පිළිබඳ අධ්‍යයනයක්

මහකච්චකොඩියේ පඤ්ඤාසේකර හිමි* සහ පනාමුරේ චන්දිම හිමි

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය අනුරාධපුරය

**mpannasekara@yahoo.com*

ජනශ්‍රැති යනු ප්‍රාථමික හෝ සංකීර්ණ බවට පත් නූතන ජනසමූහයක් අතර කාලයක් තිස්සේ මුඛ පරම්පරාගත සම්ප්‍රදායෙන් ව්‍යාප්ත වූ ඥාන සම්භාරය යි. එය ගද්‍යයෙන් හෝ පද්‍යයෙන් හෝ ඒ දෙකෙන්ම නිර්මාණය වී පරම්පරාවෙන් පරම්පරාවට පැවත යනු දැකිය හැකි ය. ඒ අතුරින් ජනකවිය ඉතා ජනප්‍රිය මෙන්ම සෞන්දර්යාත්මක ජනශ්‍රැති විශේෂයකි. ස්වභාවධර්මය හා බද්ධ වුණ ජීවන අරගලය තුළ ගොඩ නැගෙන කායික හා මානසික වේදනාවන් දුරු කරගැනීමට මෙන් ම මානසික තෘප්තිය ගොඩනගා ගැනීමට කවි ගායනවට ගැමියන් හුරු වී ඇත. එසේ ගොඩනැගෙන කවිය තුළ ඔවුන් විශ්වාස කරන ආගමික හරයන් ප්‍රමුඛ කරගෙන තිබීම සුවිශේෂී වේ. බෞද්ධ දර්ශනයෙන් හා බෞද්ධ සංස්කෘතියෙන් පෝෂණය වූ සිංහල ජන සමාජයේ ගැමියන් බුදුරජාණන් වහන්සේ හා බෞද්ධ දර්ශනයෙන් කියැවෙන දෙවි වරුන් තම කවි ගායනාවල වස්තු විෂය බවට පත් කරගෙන ඇත. එ පමණක් ද නොව තම ජීවන අරගලය හා සම්බන්ධ යම් යම් සංසිද්ධිවලට අනුරූපී වන මුල් බුදුසමයේ හරයන් ද වස්තු විෂය වී ඇත. ඒ අතුරින් ශ්‍රද්ධාව, අනිත්‍ය ධර්මතාව, කර්මය, පුනර්භවය, චතුරාර්ය සත්‍ය, හේතුඵල ධර්මය, සීලය, දානය මෙන්ම කරුණාව හා මෛත්‍රිය ද සුවිශේෂි වේ. තම ජීවිතය හා සම්බන්ධ සමීපතමයන්ගෙන් වෙන්වීම දරාගත නො හැකි තැන එය අනිත්‍ය ධර්මයෙන් දැක සිත පාලනය කරගත් ආකාරය කවිය තුළින් පෙන්වා දී ඇත. එමෙන් ම ලෙඩ දුක්, දුක් දොම්නස් උපන් කර්මයට අනුව සිදු වන්නක් ලෙසින් තමන් ඒ සියල්ලට මුහුණ දෙන ආකාරය කවි මගින් සමාජ ගත කර ඇත. එවැනි මනෝභාවයන් හා සැබැඳි ජන කවියෙන් නිරූපණය වන මුල් බුදු සමයේ භාවිතයන් මොනවා ද යන ගැටලුව මුල් කරගෙන මෙම පර්යේෂණය සිදු කරන ලදි. සාම්ප්‍රදායික ජන සමාජයේ ගැමියන්ගේ බෞද්ධ දාර්ශනික භාවිතාවන් ජන කවිය ඇසුරෙන් අධ්‍යයනය කිරීම ප්‍රධාන පරමාර්ථය වශයෙන් ගෙන ජන කවියෙන් ගොඩනැගුණ ආකල්ප සංවර්ධනය, නායකත්වය, නොපසුබට වීර්ය වැනි අවශේෂ අරමුණු මෙම පර්යේෂණයෙන් සාධනය කරගත්හ. නිදසුන් ලෙසින් කර්ම සංකල්පය විදහාපාන ජනකවියක් ලෙසින්'' තණ්ඩලේ දෙන්නා දෙපොළේ දක්කනවා..''යන කවියත් පුරුෂාර්ථ සාධනයේ දී ''කල්බලා නො වෙද ගොවිතැන් කරන්නේ'' යනාදි වශයෙන් පර්යේෂණයේ දී හඳුනාගෙන තිබේ. එම හඳුනාගැනීම්වලට අනුව, ගැමියන් ජීවන රටාව මුල්කරගෙන ඇතිවන කායික හා මානසික වේදනාවන් දුරු කරගැනීමට බෞද්ධ දාර්ශනික හරයන් ඉතා මැනවින් භාවිත කරමින් පැල්කවි, කරත්ත කවි, ගොයම් කවි, නෙළුම් කවි, පාරු කවි, ඒ ඒ අවස්තාවන්ට උචිත ආකාරයෙන් ගායනා කොට දුක් දොම්නස් තුලිත කොට කායික හා මානසික වෙහෙස සම්පර්ෂණය කරගැනීම මැනවින් සිදුකර ඇති බව මෙම පර්යේෂණයෙන් අනාවරණය විය.

***ප්‍රමුඛ පදඃ*** *ජනකවිය, බෞද්ධ දර්ශනය, ගැමිජීවිතය*